ගොඩකවෙල ප්‍රාදේශීය සභාව
රත්නපුර දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන

-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශය 2014 පෙබරවාරි 24 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 25 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 සැප්තැම්බර් 22 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ගොඩකවෙල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

---------------------------------------------------------------------

ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම් ප්‍රමිත අංක 01 හි 21 ඡේදයට අනුව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ යුතු පහත සඳහන් ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණි.

i. මුදල් ප්‍රවාහ ප්‍රකාශය.
ii. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සාරාංශය.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) පුස්තකාලය හා සෞඛ්‍ය මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා සමාලෝචිත වර්ෂය අවසාන වනවිට දේශිය ණය හා සංවර්ධන අරමුදලෙන් ලැබී තිබූ ණය ශේෂය රු. 9,846,268 ක් වුවද, ප්‍රධාන ලෙජරයේ දේශීය ණය සංවර්ධන අරමුදල් ණය ගිණුමේ දක්වා තිබූ ශේෂය රු. 6,435,803 ක් වූයෙන් ශේෂ පත්‍රය තුල ණය ප්‍රාග්ධනය රු. 3,410,465 ක් අඩුවෙන් දක්වා තිබුණු අතර එය සාවද්‍යව ආසියානු සංවර්ධන බැංකු ප්‍රදාන යටතේ ගිණුම් ගත කර තිබුණි.

(ආ) දේශිය ණය හා සංවර්ධන අරමුදලේ ණය සඳහා සමාලෝචිත වර්ෂය තුලදී ගෙවීම් කරන ලද රු. 1,245,817 ක පොලී මුදල තුල ඇතුලත්ව තිබූ ඉකුත් වර්ෂයට අදාල රු. 367,119 ක පොලිය දෝෂසහගතව 2013 වර්ෂයේ වැය ශීර්ෂයට හර කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේදී තවදුරටත් ගෙවිය යුතු රු. 60,638 ක පොලිය ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) බලවින්න කොන්ක්‍රීට් අංගනයේ ණය මුදලක් පියවීම සඳහා සභාවට ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායමින් රු. 205,653 ක් පළාත් පාලන දෙපාර්තමේන්තුව මඟින් ඍජුවම අඩුකර එකී ආයතනයට යොමු කිරීමෙන්

සභාවේ මුද්දර ගාස්තු ආදායම් වශයෙන් ගිණුම්ගත කල යුතු රු. 205,653 ක මුදල සමාලෝචිත වර්ෂයේ ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුලදී වාණිජ ගිණුමට අදාල රු. 2,412,509 ක ආදායමක් සහ රු. 2,422,205 ක වියදම් එම ගිණුමේ ගිණුම්ගත වී නොතිබුණි.

1.3.3 ලැබිය යුතු ගිණුම්
----------------------
සේවය අත්හිටුවීම හේතුකොටගෙන හා සේවා ස්ථාන මාරු ලැබ ගිය නිළධාරීන් හා සේවකයන් 05 දෙනෙකුගෙන් රු. 67,900 ක සේවක ණය ශේෂයක් සභා අරමුදලට ලැබිය යුතුව තිබුණි.

1.3.4 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම
------------------------------------------------------
පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි විධිවිධාන වලට හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව. | අනුකූල නොවීම්. |
|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 184 වගන්තිය යටතේ සාදන ලද ශ්‍රී ලංකා ජනරජයේ 2005 ජූනි 08 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ රීති | අදාල රීතීන්ට පටහැනිව සභිකයින් තිදෙනෙකු සඳහා රු. 15,000 ක සභික දීමනා ගෙවා තිබුණි. |
| (ආ) | <u>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය</u><br>මුදල් රෙගුලාසි අංක 371 (2) (ඇ) | අවස්ථා 05 කට අදාලව රු. 378,000 ක වටිනාකමැති අත්තිකාරම් එලෙස පියවීම් සිදුකර නොතිබුණි. |

1.3.5 බලය නොළත් ගනුදෙනු
----------------------------
කිසිඳු පූර්ව අනුමැතියකින් තොරව සභිකයින් 13 දෙනෙකු වෙනුවෙන් සභික දීමනා මඟින් ආපසු අයකර ගැනීමේ පදනමින් රු. 260,000 ක අත්තිකාරම් සභා අරමුදලින් ගෙවා තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය
-----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය
-----------------
ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ මෙහෙයුම් අයභාරය රු. 2,073,127 ක් වූ අතර,ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්මවූ මෙහෙයුම් අයභාරය රු. 6,725,944 ක් විය.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

---------------------------------------

පසුගිය වර්ෂයන්ට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය මෙහෙයුම් අතිරික්තය සියයට 69 කින් අඩුවී ඇති අතර, ඊට ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ පසුගිය වර්ෂයන්ට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් වල වැඩිවීම සහ වෙනත් අයභාර ආදායම් අඩුවීමයි.

2.3 ආදායම් පරිපාලනය

------------------------

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

-------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. '000' | රු. '000' | රු. '000' |
| වරිපනම් හා බදු | 2,852 | 3,604 | (752) |
| බදු කුලී | 7,163 | 6,430 | 733 |
| බලපත්‍ර ගාස්තු | 570 | 539 | 31 |
| වෙනත් ආදායම් | 5,900 | 17,272 | (11,372) |

2.3.2 වරිපනම් බදු

------------------

සමාලෝචිත වර්ෂය අවසානයට රක්වාන උප කාර්යාලයේ හිඟ වරිපනම් බදු ශේෂය රු. 179,478 ක් විය.

2.3.3 බදු කුලී

---------

රක්වාන පොදු වෙළඳ සංකීර්ණයේ කඩකාමර 03 ක කඩකුලී රු. 131,955 ක ආදායමක් 2013 දෙසැම්බර් 31 දිනට හිඟහිට තිබූ අතර, අංක 24, 25, 29, 30, 31 යන කඩකාමර 2013 වර්ෂයේදී ද ටෙන්ඩර් කර ලබානොදී කිසිදු ආදායමක් ලබා ගැනීමට කටයුතු නොකර වසා දමා තිබුණි.

2.3.4 අක්කර බදු

----------------

විගණිත දිනය වූ 2014 මාර්තු 11 දිනට වර්ෂ 01 සිට වර්ෂ 05 කට වැඩි කාල සීමාවක් දක්වා හිඟ අක්කර බදු ලෙස පුද්ගලයින් 211 දෙනෙකු වෙතින් රු. 62,644 ක් අයවීමට තිබූ අතර, ඉඩම් සතොයක්ෂණයක් මඟින් ගාස්තු සංශෝධනය කර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

2.3.5 ඉඩම් බදු

-------------

ටෙලිකොම් මධ්‍යස්ථානය පිටුපස සභාව සතු ඉඩම සඳහා 2013 වර්ෂයේ කිසිඳු ආදායමක් ලැබී නොතිබුණි. වර්ෂ ආරම්භයේ හිඟ ශේෂය රු. 10,000 ක් විය. 2010 අගෝස්තු 03 දින සිට බදුකරු විසින් අයිතිවාසිකම් පාන මෙම ඉඩමේ සභාව සතු අයිතිය පිළිබඳව ගැටළුසහගත තත්ත්වයක් මතු වී ඇත.

2.3.6 දැන්වීම් පුවරු ගාස්තු

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

සභා බල ප්‍රදේශය තුල 2013 වර්ෂයට අදාල බලපත්‍ර ලබාගෙන ප්‍රදර්ශනය කල දැන්වීම් පුවරු වලට අදාලව ආයතන 11 කින් රු. 268,317 ක මුදලක් අයවීමට තිබූ අතර, ඉහත හිඟ මුදල් අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් පියවර කිසිවක් ගෙන නොතිබුණි. තවද, අදාල පාර්ශව සභාවට පැමිණ සිදුකරන ගෙවීම් අයකර ගැනීමෙන් ඔබ්බට එම ගාස්තු අයකර ගැනීම උදෙසා සුදුසු වැඩපිළිවෙලක් හෝ අනවසර දැන්වීම් පුවරු ඉවත් කිරීමේ ප්‍රශස්ථ වැඩපිළිවෙලක් හෝ සභාව සතුව නොතිබුණි.

ප්‍රාදේශීය සභාවේ ආදායම් පරිපාලක නිළධාරී සමඟ 2014 මාර්තු 10 දින ගොඩකවෙල සිට මාදම්පේ හංදිය දක්වා රත්නපුර මාර්ගයේ දෙපස පිහිටි වෙළඳසැල්වල ප්‍රදර්ශනය කර තිබූ දැන්වීම් පුවරු පිළිබඳව සිදුකල නියැදි පරීක්ෂාවේදී 2013 වර්ෂය සඳහා වෙළඳසැල් 13 ක් සභාවේ විධිමත් අනුමැතියකින් තොරව දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කර ඇති බව අනාවරණය විය. නමුත්, අනතුරුව වෙළඳසැල් 04 ක් නියමිත ගාස්තු ගෙවීම් කලද, ආයතන 09 ක දැන්වීම් පුවරු සභා අනුමැතියකින් තොරව තවදුරටත් ප්‍රදර්ශනය කර තිබුණි.

2.3.7 ජල ගාස්තු

--------------

රක්වාන ජල ව්‍යාපෘතියේ ජල පාරිභෝගිකයන් 317 දෙනෙකුගෙන් පාරිභෝගිකයින් 58 ක් සඳහා පමණක් ජල මනු සවිකර තිබූ අතර අනෙක් පාරිභෝගිකයින් සඳහා ප්‍රමාණවත් ජලය සම්පාදනය කර නොතිබීමෙන් එක් පාරිභෝගිකයකුගෙන් මසකට රු. 100 බැගින් වූ සුළු ආදායමක් පමණක් අයකරගෙන තිබුණි.

2.3.8 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-------------------------------

(අ) සමාලෝචිත වර්ෂය සඳහා ලැබිය යුතු උසාවි දඩ ආදායම් හඳුනාගැනීමට කටයුතු කර නොමැති අතර, පැල්මඩුල්ල දිසා මහේස්ත්‍රාත් අධිකරණය මඟින් 2013 ඔක්තෝබර් මස දක්වා ලැබී ඇති රු. 1,024,667 ක් හා ඇඹිලිපිටිය දිසා මහේස්ත්‍රාත් අධිකරණය මඟින් 2013 පෙබරවාරි දක්වා ලැබී ඇති රු. 502,039 ක් පමණක් 2013 දෙසැම්බර් 31 දිනට ලේඛණගත කර තිබුණි.

(ආ) 2013 මාර්තු මාසයෙන් පසු ඉඩම් රෙජිස්ට්‍රාර් ජෙනරාල් මඟින් ලැබිය යුතු මුද්දර ගාස්තු හඳුනාගෙන ලේඛණ පිළියෙල කර,ගිණුම් ගත කර,නියමිත ආදායම් ගෙන්වා ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

2.3.9 කර්මාන්ත බදු

-------------------

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පිහිටා ඇති කර්මාන්ත බදු, ව්‍යාපාර බදු හා වෙළඳ බලපත්‍ර බදු අයකල යුතු ව්‍යාපාර හඳුනාගැනීම උදෙසා වාර්ෂික සමීක්ෂණයක් විගණිත දිනය වූ 2014 මාර්තු 05 වන දින වනවිටද සිදුකර නොතිබුණි. ව්‍යාපාර වර්ගය අනුව එකතුවන ආදායම පදනම් කරගෙන එම බදු වලට අදාලව ආදායම් ලේඛණ පවත්වා තිබුණි.

2.3.10 කඩකාමර බදු

-------------------

රක්වාන පොදු වෙළඳ සංකීර්ණයේ අංක 29 දරන කඩකාමරයේ 2013 දෙසැම්බර් 31 බදුකරුගෙන් රු. 12,950 ක හිඟ කඩකුලියක් අයවීමට තිබූ අතර, බදුකරු සමඟ නීත්‍යානුකූල ගිවිසුමකටද එළඹ නොතිබුණි.

2.3.11 වෙනත් ආදායම්

----------------------

සභා බල ප්‍රදේශය තුල විශාල වශයෙන් ක්‍රමානුකූල නොවූ ත්‍රීරෝද රථගාල් දක්නට ලැබූ නමුත්, ඒ සඳහා නිශ්චිත ස්ථාන සලකුණු කර පහසුකම් සලසා දීමෙන් අනතුරුව අතුරු ව්‍යවස්ථාවක් පනවා වාර්ෂික හෝ මාසිකව සභාවට ආදායමක් ලබාගැනීමට වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

සභාව සතු බැකෝ යන්ත්‍රයේ ධාවන සටහන් අනුව සමාලෝචිත වර්ෂය තුල සභා කර්මාන්ත සඳහා යන්ත්‍ර පැය 1102 ක් හා පෞද්ගලික අංශයට කුලී පදනම මත යන්ත්‍ර පැය 199 ක් ලෙස යන්ත්‍ර පැය 1301 ක් සේවයේ යොදවා තිබුණි. ඒ සඳහා වූ ධාවන සටහන් වගකිව යුතු නිළධාරියෙකුගේ අධීක්ෂණයට ලක්වී නොතිබුණි. අවස්ථා 283 කදී සභාපති අනුමැතිය මත සභා කර්මාන්ත සඳහා රු. 2,425,590 ක් වටිනාකමැති වැඩ ඉටුකර තිබුණද, ඒ සඳහා තාක්ෂණික නිළධාරියෙකුගේ ඇස්තමේන්තුවක් හා සභා අනුමැතියක් ලැබී තිබූ බවට තහවුරු නොවුණි. එසේම වැඩ අවසන් වාර්තා හෝ වෙනත් අදාල ලිපිගොනු කිසිවක් විගණනයට ඉදිරිපත් නොවුණි.

3.2 කොන්ත්‍රාත් පරිපාලනය

---------------------------

ඇස්තමේන්තුගත පිරිවැය රු. 236,865 ක්වූ ගොඩකවෙල සතිපොළ භූමියේ ගොඩනැගිලි පින්තාරු කිරීමට අදාල කාර්යයෙහි වැඩ විෂයය අංක 06 යටතේ බිත්ති පිරිසිදු කොට තීන්ත දෙවරක් ආලේප කිරීම වෙනුවෙන් වර්ග එකකට රු. 2,699.55 බැගින් වර්ග 72.75 ක් සඳහා රු. 196,392 ක් ගෙවීම් කර තිබුණි.
2014 මාර්තු 14 දින සිදුකල භෞතික පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(1) බිත්ති මනාලෙස පිරිසිදු කර නොතිබූ අතර ආයුර්වේද ගොඩනැගිල්ල හැර ඉතිරි ගොඩනැගිලි වල එක් වරක් පමණක් තීන්ත ආලේප කර ඇති බවත්,

(11) ඒ අනුව වර්ග 48.677 ක එක් වරක් පමණක් තීන්ත ආලේප කර ඇති බැවින් එයට අදාලව ගෙවන ලද රු. 65,703 ක මුදල වැඩිපුර ගෙවීම් කර තිබුණි.

(111) මෙම කර්මාන්තයට අදාල ඇස්තමේන්තුවේ විෂයය අංක 06 යටතේ වර්ග 55 ක් සඳහා පමණක් බිත්ති හොඳින් පිරිසිදු කර තීන්ත දෙවරක් ආලේප කිරීම වෙනුවෙන් රු. 148,475 ක් ඇස්තමේන්තු කර තිබුණද, එම ඇස්තමේන්තුව ඉක්මවා වර්ග 72.75 ක් ඉටුකල වැඩ වෙනුවෙන් ගෙවීම් කර තිබුණි.

3.3 පරිසර කළමනාකරණය

-------------------------------

ගොඩකවෙල නගර අලංකරණයට බාධා පමුණුවමින් හා නගරය හරහා ගලාබසින දොඹකොල ඇල රක්ෂිත ප්‍රදේශයට ද හානි කරමින් ඇල මාර්ග මැද ඉදිකිරීම් ගණනාවක් සිදුකර තිබුණි. 2010 ජූලි 14 දිනැති අංක 1662/17 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශිත රාජ්‍ය ආරක්ෂක අමාත්‍යවරයාගේ නියෝගයට අනුව මෙම ඉදිකිරීම් සිදුකර ඇති භූමියද රක්ෂිතයක් බැවින් එහි කිසිඳු තාවකාලික හෝ ස්ථිර ඉදිකිරීමක් නොකල යුතු අතර, මෙම භූමියේ සිදුකරන ඕනෑම කටයුත්තක් සඳහා ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව නියම කරනු ලබන කොන්දේසි වලට යටත්ව එහි ප්‍රධාන විධායක නිළධාරීගේ පූර්ව ලිඛිත අනුමැතියක් ලබාගත යුතු වුවද, මෙම ඉදිකිරීම් සඳහා එවැනි කිසිඳු අනුමැතියක් ලබාගෙන නොතිබුණි. දිගින් දිගටම සිදුවන මෙම අනවසර ඉදිකිරීම් මඟින් ජල රක්ෂිතයට හානි වීම පමණක් නොව නගර අලංකරණයටද බාධා සිදුවන බව විගණනයට නිරීක්ෂණය විය. වගකිවයුතු පාර්ශවයන් අතර සිදුවන ලිපි ගනුදෙනු හැර මෙම අනවසර ඉදිකිරීම් වලට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගැනීම ප්‍රමාද වී තිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-----------------------------------------

4.1 අභ්‍යන්තර විගණනය

------------------------

1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 5(7) ප්‍රකාරව මූල්‍ය හා ගබඩා සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් පවත්වා නොතිබුණි.

4.2 අයවැය පාලනය

-------------------

(අ) වැය ශීර්ෂ අංක 309 සඳහා සලසා තිබූ ප්‍රතිපාදන ඉක්මවා රු. 4,999,496 ක් අතිරික්ත වියදම් දරා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා වැය විෂයයන් 26 කට වෙන් කරන ලද රු. 191,000 ක ප්‍රතිපාදන කිසිඳු වියදමක් නොදරා ඉතිරි වී තිබූ අතර, වැය ශීර්ෂ 69 කට අදාලව වෙන් කරන ලද ප්‍රතිපාදන වල රු. 8,660,801 ක ඌන උපයෝජනයක්ද විය.

5. පද්ධති හා පාලන

----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය

(ඉ) පාරිසරික